# තනතුරු ඇබෑර්තු

# ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

## කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

### පුල්මුඩේ යන්ත්‍රාගාරයේ (ප්‍රාථමික ශිල්පීය සේවා ගණය)

### කාර්මික / මෝටර් කාර්මික තනතුර - (ස්ථිර)

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් ආයතනය සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමක් වන අතර, ඛනිජ වැලි කැණීම සැකසීම් කිරීම සහ අලෙවි කිරීම ප්‍රධාන කාර්ය භාරය වේ. රජයට විදේශ විනිමය උපයාදෙනු ලබන මුල් පෙළේ ආයතනයක් වන අප ආයතනයේ ප්‍රධාන කාර්යාලය රාජගිරියේ පිහිටා ඇති අතර, නිෂ්පාදන යන්ත්‍රාගාරය ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පුල්මුඩේ ග්‍රාමයේ පිහිටා ඇත. මේ වන විට ප්‍රධාන වශයෙන් ඛනිජ වැලි වෙන් කිරීමෙන් පසුව අපනයනය කරනු ලබන අතර, ඉදිරි කාලයේදී මෙම ඛනිජ වැලි සඳහා අගය එකතු කිරීමේ කාර්යයක් සඳහා පිවිසීමට නියමිත වේ. ආයතනය පිළිබඳ අනෙකුත් විස්තර අප ආයතනයේ **www.lankamineralsands.lk** අංක දර්ශ වෙබ් අඩවියේ දක්වා ඇත.

ඒ අනුව ආයතනයේ අනාගත අරමුණු සහ ඉලක්ක සඳහා ළඟාවීමට සහාය දිය හැකි පහත සඳහන් තනතුරෙහි සේවය කිරීමට කැමති අය වෙත ආයතනයේ කොටස්කරුවෙකු වන ලෙස ආරාධනා කරනු ලැබේ.

කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016 ප්‍රකාර වැටුප් ගෙවීම් කරනු ලබන අතර, ඊට අමතරව පිරිනැමෙන පුළුල් විශේෂ දීමනා සහ වරප්‍රසාද රැසක් හිමි වේ.

**01. කාර්මික / මෝටර් කාර්මික** (Mechanics / Motor Mechanics)

**පුරප්පාඩුව පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය)**

**තනතුරු පුරප්පාඩු ගණන 02**

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් - බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) ක් සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.

සමග

**ශිල්පීය නිපුණතා / ප්‍රවීණතා**

කාර්මික / මෝටර් කාර්මික තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.

1). කාර්මික /මෝටර් කාර්මික ක්ෂේත්‍රයෙහි වසර පහක (05) ක පළපුරුද්ද හා කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් කාර්මික, මෝටර් කාර්මික තනතුරෙහි කාර්ය භාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) සිව්වැනි (04) මට්ටමට නොඅඩු වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වන ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL-2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL-1) සේවා ගණයක සේවකයින්

හෝ

2). කාර්මික / මෝටර් කාර්මික තනතුරෙහි කාර්යය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම .

මීට අමතරව හයිඩ්‍රොලික් තාක්ෂණය පිළිබඳ දැනුම තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකා බලනු ලැබේ.

PL-3 සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

වැටුප් කේත අංකය-PL- 3

රු.26,290/-10X270-10X300-10X330-12X350-39,490/-

**2017.01.01 දින සිට පහත සඳහන් පරිදි වැටුප් හිමිවේ.**

| 2017 | | 2018 | | 2019 | | 2020 | |
|---|---|---|---|---|---|---|---|
| වැටුප රු | ගැළපුම් දීමනාව රු | වැටුප රු | ගැළපුම් දීමනාව රු | වැටුප රු | ගැළපුම් දීමනාව රු | වැටුප රු | ගැළපුම් දීමනාව රු |
| 18,118/- | 7,203/- | 20,842/- | 4479/- | 23,566/- | 1755/- | රු.26,290/- | --- |

(අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටුවනු ලබන යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.)

**ගෙවනු ලබන වැටුපට අමතරව, පහත සඳහන් මාසික දීමනාවන් ද හිමිවේ.**

01. භාණ්ඩාගාරය අනුමත කළ රු. 7,800/- ක් වන ජීවන වියදම් දීමනාව.
02. දිනකට රු. 150/- වන මාසික ආහාර දීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
03. මසකට රු. 2,000/-ක උපරිමයකට යටත්ව මාසික පැමිණීමේ දිරි දීමනාව - දෛනිකව පැමිණීම මත පදනම් වේ.
04. මසකට රු. 4,000/-ක් වන දුෂ්කර දීමනාව(පුල්මුඩේ යන්ත්‍රාගාර සේවකයින් සඳහා පමණයි)
05. මසකට රු. 1800/- ක් වන ප්‍රවාහන දීමනාව.-දෛනික පැමිණීම මත පදනම් වේ.

**වෙනත් ප්‍රතිලාභ**

01. වාර්ෂික නිෂ්පාදන දිරි ගැන්වීම් දීමනාව
02. වාර්ෂික ප්‍රසාද දීමනාව (බෝනස්)
03. ශල්‍ය හා රෝහල් ගතවීමේ හා බාහිර ප්‍රතිකාර සඳහා රක්ෂණාවරණය
    i. වසරක් සඳහා රු.150,000/- ක රෝහල් ගත වීමේ රක්ෂණ ආවරණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)
    ii. වසරක් සඳහා රු.20,000/- ක බාහිර ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)
    iii. වසරක් සඳහා රු.5,000/- ක දන්ත ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)
04. ලබාගෙනත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල්
05. ස්ථාවර (නිශ්චිත) සීමාවක් දක්වා වෛද්‍ය වියදම් ලබාදීම
    i. වසරකට වරක් රු.5,000/- ක දීමනාව (සාමාන්‍ය වෛද්‍ය ගාස්තු සඳහා)
    ii. වසර දෙකකට වරක් රු. 12,000/- ක දීමනාව (විශේෂඥ වෛද්‍ය ගාස්තු, වෛද්‍ය පරීක්ෂණ ගාස්තු, ඇස් කණ්ණාඩි හා ශ්‍රවණාධාර වියදම් සඳහා)
    iii. දරු උපතක් වෙනුවෙන් වසර 2 කට වරක් රු. 12,000/- ක දීමනාව
06. සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය 10% සහ සමාගම විසින් 15% ක දායකත්වය ( සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා 3% ඇතුළත්ව)
07. මීට අමතරව ස්ථිර සේවකයින් සඳහා වන වෙනත් ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ඇත.

**පොදු කොන්දේසි**

1. සෑම ඉල්ලුම්කරුවෙක්ම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
4. තෝරාගනු ලබන අයදුම්කරුගේ මුළු ඉපයීම් වලින් උපයන විට ගෙවීමේ බද්ද (PAY as You Earn - PAYE Tax) අයකර ගනු ලැබේ.

**වයස් සීමාව:** අවු 18 ට නොඅඩු විය යුතු අතර, අවු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

රාජ්‍ය සේවයේ / සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහ රාජ්‍ය සමාගම් වල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්‍ර තම අදාළ දෙපාර්තමේන්තුවල / ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

ඉහත දක්වන ලද තනතුර සඳහා වන අයදුම්පත් (අදාළ සහතික පත්‍රවල ඡායාපිට පිටපත් ද සමග) ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ, අයදුම් කරන තනතුර පැහැදිලිව සටහන් කර රාජගිරිය, සරණ මාවතේ, අංක 341/21 හි ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් හි නිධි බලධාරී වෙත ලැබෙන සේ 2017 ජූනි මස 30 දින හෝ ඊට පෙර යොමු කළ යුතු වේ.

**සාමාන්‍යාධිකාරී,**
**ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්,**
**අංක 341/21, සරණ මාවත, රාජගිරිය.**

Source: Dinamina, Daily News (2017.06.16)